ධරණී පුවත්පතේ, "රැඩිකල් ගෑනු බැලූ බැල්මට ලස්සනයි, හැබැයි ටිකක් බලන් ඉන්නකොට අප්පිරියයි" යන සිරස්තලයෙන් යුතුව පළවී තිබූ ලිපියකි. මෙය ජීවන කුසලතා සහ පෞරුෂ වර්ධන උපදේශිකා අනීෂා ජයකොඩි ගේ අදහස් එක්තැන් කොට සම්පාදනය වූවකි. එම ලිපිය, දෙරණ අරුණ (06/29) වැඩසටහන තුළද අවධානයට ලක්වී තිබිණි.

මෙම ලිපියේ දැක්වී තිබූ ඇතැම් අදහස් මෙසේය.

1) "හැබැයි එහෙමයි කියලා, රැඩිකල් උණ සන්නිපාතේ හැදිලා, එක සැරේ කොල්ලෝ දෙතුන් දෙනෙක් එක්ක ඩේටින් කරන්න හිතෙනවනම්, ගෙදර වැඩට ඉන්න කෙනා ගමේ ගිය වෙලාවකවත් උයලා පිහලා, වලන් දෙක තුන හෝදලා ගෙදර අස් කරගන්න බැරි නම්, මහත්තයා කන්න ආස කෑමක් බීමක් ඉඳලා හිටලා හරි හදලා දෙන එක පවක් කියලා හිතෙනවනම්, මිනිහට දරුවන්ට හොරෙන් යාළුවොත් එක්ක බාර් එකකට ගිහින් වැටෙනකම් බීලා නටන්න හිතෙනවනම්, දරුවෝ වෙනුවෙන් එක රැයක් නිදිමරන්න බැරිනම්, උන්ගේ පස්ස හෝදලා නිදිකරවන්න බැරිනම්, ඉඳලා හිටලා හරි සැමියාට තුරුල්වෙලා හුරතල් වෙන එක මෝඩකමක් කියල හිතෙනවනම්, ඒක රැඩිකල්කම නෙමෙයි, ඒක නොලැබීම."

2. "රැඩිකල් වෙන්න ගිහින් ගැහැනුන්ට ආවේණික ඒ සුන්දර ලාලිත්‍ය, ආදරණීය දක්ෂකම්, වාසනාවන්ත බොළඳකම් නැතිකරගත්තොත් අන්තිමට ඉතුරුවෙන්නෙ පිරිමින්ටත් වඩා මෝරපු දරදඬු වෙච්ච ගස් වගේ ගැහැනු."

3. "ගැහැනු රැඩිකල් වෙන්න ඕනෙ ගෑනුකම් අස්සෙ මිසක් පිරිමිකම් අස්සෙ නෙමෙයි. ගැහැනුකම සම්පූර්ණයෙන්ම මරලා, ඕනවට වඩා රැඩිකල් වෙච්ච ගැහැනු දැක්කම ලස්සනයි, හැබැයි ටිකක් වෙලා බලන් ඉද්දී අප්පිරියයි."

4. "ඕනවට වඩා බොරුවට පොෂ් වෙන්න, බොරුවට බිසී වෙන්න, අමුතු විදිහට රැඩිකල් වෙන්න ගිහිං ගැහැනු නැති කරගන්නේ, තමන්ට ජීවිතේ විඳින්න තියන රසවත්ම කොටස කියල තේරෙනකොට සමහරවිට ඔයා පරක්කු වැඩි වෙයි."

මෙම ලිපිය පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

ධරණී නිල ෆේස්බුක් පිටුවේ පළව ඇති එම ලිපිය වෙත ප්‍රවේශය:

[https://www.facebook.com/.../a.116473376.../214876623821117/](https://www.facebook.com/.../a.116473376.../214876623821117/)